www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ශ්‍රී ලංකාවේ මැතිවරනය:

# සසප, එල්ටීටීඊ ප්‍රදේශවල ඡන්දදායකයන්ගේ ඡන්ද අයිතිය පැහැරගැනීමට එරෙහි වෙයි

## SEP opposes disenfranchisement of voters in LTTE areas

**විජේ ඩයස් විසිනි**
**2004 මාර්තු 30**

උතුරේ හා නැගෙනහිර, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පාලනය යටතේ පවත්නා ප්‍රදේශවල ජීවත් වන ඡන්දදායකයන් වෙනුවෙන්, ඡන්ද මධ්‍යස්ථාන නො පිහිටුවීමට, ශ්‍රී ලංකාවේ මැතිවරන කොමසාරිස්වරයා විසින් ගෙන ඇති තීන්දුව, සමාජවාදී සමානතා පක්ෂය (සසප) තරයේ හෙළා දකී. මෙය වනාහි ජනගහනයේ විශාල කොටසක සිවිල් අයිතීන් අමු අමුවේ උල්ලංඝනය කිරීමකි. මෙම ඊනියා මුදා නො ගත් ප්‍රදේශවල විභව ඡන්දදායකයන් 275,000ක් සිටී යයි තක්සේරු කෙරෙන අතර ඔවුන්ගෙන් අති මහත් බහුතරයක් දෙමල ජාතිකයන් ය. දැන් ඔවුහු අප්‍රේල් 2 දා මැතිවරනයෙන් තථ්‍ය වසයෙන් ම ඉවත් කෙරෙනු ඇත.

මේ පිලිබඳ අවසන් තීන්දුව ගනු ලැබුවේ මාර්තු 25 දා ය. මෙවන් කරුනු සම්බන්ධයෙන් පූර්න බලතල මැතිවරන කොමසාරිස්වරයා සතු වන නමුත්, මෙම ප්‍රදේශවල දෙමල ඡන්දදායකයන් මැතිවරන ක්‍රියාවලියෙන් පිටමං කරන ලෙස, සිංහල ජනයා මත පදනම් වූ සියලුම පක්ෂ වෙතින් එල්ල වූ, බලගතු පීඩනයකට මුහුන දීමට, ඔහුට සිදු විය. ඔවුනගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ආස්ථානය, දෙමල විරෝධී මනෝගතීන් ඇවිස්සීම එල්ල කර ගත් අතර ම කයෝර මැතිවරනමය ගනන් බැලීම්වලින් මෙහෙය වේ.

එයින් වැඩිම වාසි ලබා ගනු ඇත්තේ, එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) ලෙස එක්වී සිටින, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සහ සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) යි. මෙම පක්ෂ දෙක, මාස ගනනාවක් තිස්සේ, එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුවටත් එල්ටීටීඊය සමග එය ගෙන ගිය සාම සාකච්ඡාවන්ටත් එරෙහි උද්ඝෝෂනයක යෙදී සිටී. නව මැතිවරනයකට මගපාදමින්, පාර්ලිමේන්තුව විසුරුවා, ඡන්දයෙන් තේරී පත්ව තිබූ ආන්ඩුව බලයෙන් පහ කිරීමට, පෙබරවාරි 7 දා කුමාරතුංග ගත් තීන්දුවෙන්, මෙම උද්ඝෝෂනය කුලුගැන්වුනි.

"මුදා නො ගත් ප්‍රදේශ" මැතිවරනයෙන් ඉවත් කිරීම මගින්, පැවති පාර්ලිමේන්තුවේ දී එජාපෙට හා "සාම ක්‍රියාදාමයට" සහාය දුන්, දෙමල ජාතික සන්ධානයේ (ටීඑන්ඒ) ඡන්දවලට වල කැපෙනු ඇත. ටීඑන්ඒ යනු, දෙමල ජනතාවගේ එකම නියෝජිතයා තමන් යයි එල්ටීටීඊය කරන ප්‍රජාතන්ත්‍ර විරෝධී කියාපෑම පිලිගෙන ඇති, දෙමල ධනේශ්වර පක්ෂවල සභාගයකි. යම් සාම ගිවිසුමක දී, තමන්ට වාසිදායක සහන දිනාගනු පිනිස, අනාගත ආන්ඩුවට පීඩනය දැමීමේ නියම නියෝජිතයකු ලෙස, ටීඑන්ඒ යොදාගැනීමට, එල්ටීටීඊය පැහැදිලිවම බලාපොරොත්තු වේ.

කුමාරතුංග, මෙම කරුන සම්බන්ධයෙන් මූලිකත්වය ගනිමින්, ඉන්දියාවේ *හින්දු* පුවත්පතට මාර්තු 1 දා පැහැදිලිවම මෙසේ කියා සිටියා ය: "අපට මුදා නො ගත් ප්‍රදේශවල ඡන්දය පැවැත්විය නො හැක. කිසිදු මැතිවරන කොමසාරිස්වරයෙක් එයට අවසර දී නැත." එහෙත් "මුදා නො ගත් ප්‍රදේශ" යන ප්‍රවර්ගය නිල පිලිගැනීමට ලක් වූයේ, 2002 පෙබරවාරයේ දී එජාපෙ ආන්ඩුව එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව පමනි. සටන් විරාමය යටතේ, ශ්‍රී ලංකා හමුදාව විසින් පාලනය කරනු ලබන ප්‍රදේශ සහ එල්ටීටීඊ පාලනය යටතේ පවත්නා ප්‍රදේශ අතර බෙදුම් රේඛා අදිනු ලැබී ය.

2001 මැතිවරනයේ දී, එල්ටීටීඊය එම ප්‍රදේශවලට ප්‍රවිෂ්ට වීමට අවසර නො දෙනු ඇත යන පදනම මත, එල්ටීටීඊ පාලන ප්‍රදේශවල ඡන්ද මධ්‍යස්ථාන නො පිහිටුවීමට මැතිවරන කොමසාරිස්වරයා තීන්දු කලේ ය. එහෙත් මෙවර, එල්ටීටීඊය, සටන් විරාම ගිවිසුමට සිය බැඳීම පෙන්නුම් කිරීමත් ටීඑන්ඒ සඳහා ඡන්ද වැඩි කරගැනීමත් පිනිස, එම ප්‍රදේශවල ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවන ලෙස, මැතිවරන නිලධාරින්ට ආරාධනා කොට තිබේ.

*හින්දු* පත්‍රයට කුමාරතුංග දුන් සම්මුඛ සාකච්ඡාව මගින් පැහැදිලිවම ගනන් බලන ලද්දේ, මෙම කරුන සාකච්ඡා කරනු පිනිස මාර්තු 5 දා කැඳවන ලද සියලු දේශපාලන පක්ෂවල නියෝජිතයන්ගේ රැස්වීමක් කල් තැබූ, කොමසාරිස්වරයා මත පීඩනය යෙදීමටයි. ඒ අතරතුර, කුමාරතුංගට වගකියන හමුදා හා පොලිස් ප්‍රධානීහු, ඡන්ද මධ්‍යස්ථාන ආරක්ෂා කිරීමට එම ප්‍රදේශවලට සිය සන්නද්ධ හමුදාවන් යැවීමට සිදු වනු

ඇතැයි තර්ක කරමින්, එල්ටීටීඊ පාලන ප්‍රදේශවල මැතිවරනය පැවැත්වීමට එරෙහි වූහ.

දේශපාලන පක්ෂවල අදහස් විමසීමේ රැස්වීම අවසානයේ මාර්තු 12 දා පැවැත්වුනි. සසප නියෝජිත, කොලඹ දිස්ත්‍රික්කයේ පක්ෂයේ ඡන්දාපේක්ෂක, පානිනී විජේසිරිවර්ධන, එහිදී මුලින්ම තම අදහස් දැක්වී ය. එම ප්‍රදේශවල මැතිවරනය නො පැවැත්වීමේ සැලසුම, ප්‍රජාතන්ත්‍ර විරෝධී යයි හෙලා දුටු ඔහු, සුවිශේෂ ප්‍රදේශයක ඡන්ද විමසීම පැවැත්විය හැකි ද නො හැකි ද යන තීන්දුව, මැතිවරන කොමසාරිස්වරයාට ගත හැක්කේ, මිලිටරියේ හා පොලීසියේ අවවාද මත නම්, එය අනාගතය සඳහා භයානක පූර්වාදර්ශයක් තහවුරු කරනු ඇතැයි අනතුරු ඇඟවී ය.

"ඡන්ද මධ්‍යස්ථානවලට ආරක්ෂාව සැපයීමට පොලීසිය හා මිලිටරිය යොදාගැනීමට අවශ්‍ය වීම ම ධනේශ්වර දේශපාලන හා මැතිවරන ක්‍රමයේ පරිහානිය පිලිබඳ ප්‍රකාශනයකි. එය ඡන්දය දීමට මහජනතාවට පවත්නා ප්‍රජාතන්ත්‍ර අයිතියට බාධාවක් ලෙස පැවැතිය යුතු නැත." යයි ඔහු පැවසී ය.

එමෙන්ම, සසප එල්ටීටීඊයට සහාය නො දෙන බව පැහැදිලි කරමින්, විජේසිරිවර්ධන මෙසේ පැවසී ය: "සිය දේශපාලන විරුද්ධවාදීන්ගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කුප්‍රකට, එල්ටීටීඊයට, සසප, කිසිදු සහායක් නො දෙයි. එල්ටීටීඊයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවන්ට එරෙහිව, ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කරනු පිනිස, දිවයින තුල හා පිටත මහජනතාව බලමුලුගැන්වීමට, සසප සටන් වැද ඇති අතර, එම අරගලයේ දිගටම යෙදී සිටී."

විවිධ දෙපාර්තමේන්තුවලට හා රාජ්‍ය බැංකුවලට අයත් රජයේ නිලධාරින් මෙන් ම ගුරුවරුන් ද දැනටමත් එල්ටීටීඊ පාලන ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටින බව ද සසප අපේක්ෂකයා පෙන්වා දුනි. එසේ නම්, මැතිවරන කොමසාරිස්වරයා සන්නද්ධ බලඇනි යොදාගෙන ඡන්ද මධ්‍යස්ථානවලට විශේෂ ආරක්ෂාවක් ඉල්ලා සිටින්නේ මන්දැයි ඔහු ප්‍රශ්න කලේ ය. එල්ටීටීඊය සිය පාලනය යටතේ පවත්නා ප්‍රදේශවල මැතිවරන පවත්වන ලෙස නිලධාරින්ට ආරාධනා කර ඇති තතු තුල මෙය වඩාත් සැක සහිත ය.

"තමන් ජීවත් වන ඕනෑම තැනක සිට සිය ඡන්දය පාවිච්චි කිරීම මහජනතාවගේ මූලික අයිතියකි. තමන්ට එම අයිතිය නිදහසේ පාවිච්චි කල හැකි ද නො හැකි ද යන්න මහජනතාව විසින් ම තීන්දු කල යුතු ය. නිදහසේ ඡන්දය පාවිච්චි කිරීමට එරෙහිව පවත්නා, දේශපාලන පක්ෂවලින් වේවා, එල්ටීටීඊය ඇතුලු සංවිධානවලින් වේවා එල්ල වන, සියලුම ආකාරයේ බලහත්කාරයන්ට විරුද්ධ වීම, ඔවුනගේ අයිතියකි." යයි විජේසිරිවර්ධන පැවසී ය.

## ස්වෝත්තමවාදී විරුද්ධත්වය

සිංහල අන්තවාදී ජාතික හෙල උරුමයේ (ජේඑච්යූ) මාධ්‍ය ලේකම් උදය ගම්මන්පිල, එල්ටීටීඊ පාලන ප්‍රදේශවල මැතිවරනය පැවැත්වීම ගැන විරුද්ධත්වය ප්‍රකාශ කරනු පිනිස වහාම නැගී සිටියේ ය. හෙල උරුමය, එල්ටීටීඊය සමග මොන යම් හෝ සාකච්ඡාවක් පැවැත්වීමට සතුරුව සිටින අතරම, බෞද්ධාගමේත් සිංහල බහුතරයේත් අධිපතිභාවය මත පදනම් වූ වර්ගවාදී රාජ්‍යයක් සඳහා විවෘතව කැඳවුම් කරයි. ශ්‍රී ලංකා රාජ්‍ය හමුදාවල මැදිහත්වීමෙන් තොරව, එල්ටීටීඊ ප්‍රදේශවල මැතිවරනයක් පැවැත්වීම, එල්ටීටීඊයට ඡන්ද මංකොල්ලයට ඉඩ දීමකට සම වෙතැයි ඔහු ප්‍රකාශ කලේ ය.

එම තර්කය මුලුමනින්ම නරුම සහගත ය. හුදෙක් එල්ටීටීඊය පමනක් නො ව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන පක්ෂ සියල්ලම, මැර බලය හා බලහත්කාරය සම්බන්ධයෙන් කුප්‍රකට ය. ඡන්ද මංකොල්ලය, තර්ජන හා ශාරීරික ප්‍රචන්ඩත්වය මිනුම් දන්ඩ ලෙස ගත්තේ නම්. දිවයිනේ කිසිදු කොටසක මැතිවරනයක් පැවැත්වීමට මැතිවරන කොමසාරිස්වරයා සමත් නො වනු ඇත. හෙල උරුමය හා සෙසු පක්ෂ, දෙමල ඡන්දදායකයන් ලක්ෂ ගනනකගේ ඡන්ද අයිතිය දිගටම අහිමි කිරීම යුක්තියුක්ත කරනු පිනිස, එල්ටීටීඊයේ භාවිතාවන් කඩතුරාවක් ලෙස යොදා ගනී.

හමුදාව හා පොලීසිය යෙදවීම මගින් ප්‍රජාතන්ත්‍ර අයිතීන්ගේ ආරක්ෂාව සහතික කෙරෙනු ඇතැයි තර්ක කිරීම ද ප්‍රෝඩාකාරී ය. සිවිල් යුද්ධය පැවති දශක දෙකක කාලය මුලුල්ලේ, ආරක්ෂක හමුදාවෝ, දෙමල සුලුතරයේ මූලික අයිතීන් දුෂ්ට ලෙස පාගා දමා ඇත්තේ, ඔවුන් අඩන්තේට්ටම්වලට හා හිතුවක්කාරී අත්අඩංගුවලට ලක් කරමිනි. 2001 මහ මැතිවරනයේ දී, ජනාධිපති කුමාරතුංග යටතේ පැවති, හමුදාව, එල්ටීටීඊ පාලන ප්‍රදේශවල ජීවත්වන දස දහස් සංඛ්‍යාත ජනයා, ඡන්දය දීමෙන් වලකාලී ය. ඡන්දදායකයන් රජයේ පාලනය යටතේ පවත්නා ප්‍රදේශවල පිහිටි ඡන්ද පොලවලට යාමට උත්සාහ කල විට, ඔවුහු මිලිටරි සෝදිසි ස්ථානවල දී ආපසු හරවා යවන ලදි.

ඉන් එක් ඡන්දදායකයෙක්, ඉන් පසුව, සිය ප්‍රජාතන්ත්‍ර අයිතීන් උල්ලංඝනය කිරීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරනයේ නඩුවක් ගොනු කලේ ය. නඩු විභාගය තුල දී, එවකට උතුරේ හා නැගෙනහිර මිලිටරි අනදෙන නිලධාරියාව සිටි ජෙනරාල් ලයනල් බලගල්ල, ඔහුගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් දැඩි විවේචනයට ලක් විය. සෝදිසි දොරටු වසා දැමීම, "අදාල නො වන කරුනු පිලිබඳ සැලකිලිමත් වීම මගින් මෙහෙයවී ඇති" බව සඳහන් කල අධිකරනය, මෙසේ තීන්දු කලේ ය: "එය හිතුවක්කාරී ක්‍රියාවක් වූ අතර එහි අභිප්‍රාය වූයේ, බොහෝ විට දේශපාලන හේතු කරන කොට ගෙන, ඡන්දදායකයන් සිය ඡන්ද අයිතිය භුක්ති විඳීම වලකාලීම යි."

කෙසේ වෙතත්, බලගල්ලේගේ ක්‍රියාවන්, ඔහු මිලිටරියේ සමස්ත අන දෙන නිලධාරි තනතුරට ඔසවාලීමෙන් වලකාලුයේ නැත. කුමාරතුංගගේ සහාය ඇතිව, ඔහු එම තනතුරේ රැඳී සිට ඇත. ඔහු පසුගිය

වසරේ විශ්‍රාම යාමට නියමිතව තිබීම ද නො තකා, ඇය, ඔහුගේ සේවය දීර්ඝ කිරීමට පවා පියවර ගත්තා ය. 2001 දී රහසේ සිදු කරන ලද, දෙමල ඡන්දදායකයන්ගේ ඡන්ද අයිතිය පැහැර ගැනීම, දැන් 2004 මැතිවරනයේ දී, සියලු ප්‍රධාන පක්ෂවල සහාය ද ඇතිව, විවෘතව සිදු කරනු ලැබේ.

මාර්තු 12 දා පැවති අදහස් විමසීමේ රැස්වීමට සහභාගි වූ එජාපෙ ද එල්ටීටීඊ ප්‍රදේශවල ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීමට විරුද්ධ විය. එජාපෙ ලේකම් සෙනරත් කපුකොටුව යෝජනා කලේ, ඡන්ද මධ්‍යස්ථාන ආසන්න හමුදා පාලිත ප්‍රදේශවල පිහිටුවන ලෙස යි. එහෙත් ප්‍රායෝගික අර්ථයෙන් ගත් කල, මෙය ද එකම ප්‍රතිඵලය ජනිත කරනු ඇත. ප්‍රවාහන පහසුකම් ඉතා අවම වන කොන්දේසි යටතේ, ඡන්දදායකයන්ට, සමහර අවස්ථාවන්හි දී කිලෝ මීටර් 100කට අධික දුරක් පවා, ගමන් කිරීමට බල කෙරෙනු ඇත.

එජාපෙ නියෝජිතයා ඉදිරිපත් කලේ ද ඔහුගේ ප්‍රතිවාදීන් මෙන් එකම හේතුව ය: එනම්, සටන් විරාමය, පොලීසියට හා මිලිටරියට එල්ටීටීඊ පාලන ප්‍රදේශවලට ඇතුලුවීමට අවසර නො දෙන බවයි. කෙසේ වෙතත්, සැබෑ හේතු දේශපාලනික ය. එජාපෙ, කුමාරතුංග හා එජනිස ඉදිරිපත් කල වර්ගවාදී තර්කවලට අභියෝග කිරීමට මුලුමනින් ම අපොහොසත් ය. ඒ මක් නිසා ද කිය තොත්, එම පක්ෂය ද සිය ප්‍රතිවාදීන් මෙන් ම සිංහල ස්වෝත්තමවාදය තුල එරී පැවතීම ය. තමන් උතුරු හා නැගෙනහිර පලාත්වල දෙමල ජනතාවගේ අයිතීන් ආරක්ෂා කල හොත් දකුනේ සිය ඡන්ද තම ප්‍රතිවාදීන් විසින් ඩැහැගනු ඇතැයි එජාපෙ භීතියට පත්ව තිබේ.

එකදු "වමේ" පක්ෂයක් වත්, සප්‍රතිපත්තික ආස්ථානයක් ගෙන නැත. ලංකා සමසමාජ පක්ෂය (ලසසප), කොමියුනිස්ට් පක්ෂය (කොප) සහ නව සමසමාජ පක්ෂය (නසසප), මාර්තු 12 දා පැවති අදහස් විමසීමේ රැස්වීමට නියෝජිතයන් එවීමට වත් උනන්දු වූයේ නැත. මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමෙහි ලා ඔවුන් දක්වා ඇති අපොහොසත් භාවය වනාහි, ඔවුන්ගේ දේශපාලනික පරිහානියේ ද කොලඹ සමස්ත දේශපාලන සංස්ථාපිතය ම තුල ආධිපත්‍යය දරන වර්ගවාදී දේශපාලනයට ඔවුන්ගේ අනුගත වීමේ ද තවත් ප්‍රකාශනයකි.

පාලක පන්තියේ හා එහි නියෝජිතයන්ගේ ප්‍රයෝගයන්ට එරෙහිව, සිය ප්‍රජාතන්ත්‍ර අයිතීන් සඳහා සටන් වැදීමට, කම්කරු පන්තියට නිරතුරුව ම සිදු වී ඇත. 1931 දී, සිංහල හා දෙමල යන දෙපාර්ශ්වයේ ම ධනේශ්වර දේශපාලනඥයෝ. ඩොනමෝර් කොමිසම මගින් නිර්දේශ කරන ලද සර්ව ජන ඡන්ද බලය ප්‍රදානය කිරීමට බලගතු ලෙස විරුද්ධ වූහ. දේශීය ධනේශ්වරයේ භීතියට හේතු වූයේ, සාමාන්‍ය වැඩ කරන ජනතාව දේශපාලන කරලියට පිවිසීම මගින්, බ්‍රිතාන්‍ය විජිත පාලකයන් සමග තමන් ගෙන යන හොර ගනුදෙනු කඩාකප්පල් වනු ඇතැයි යන්න ය. සියලු වැඩ කරන ජනතාවට ඡන්ද බලය දිය යුතු යයි ඉල්ලා සිටියේ, ලංකා කම්කරු පක්ෂය පමනි. කලින් ඡන්ද බලය භුක්ති වින්දේ, ජනගහනයෙන් සියයට 4ක් පමනි — ඒ ධනය හා අධ්‍යාපනය පිලිබඳ මිනුම් දන්ඩක් මත ය.

1948 දී නිදහස ලැබීමෙන් පසුව, එක්සත් ජාතික පක්ෂ (එජාප) ආන්ඩුවේ ප්‍රථම ක්‍රියාව වූයේ, දශ ලක්ෂයක් පමන වූ දෙමල කතා කරන වතු කම්කරුවන්ගේ, ඡන්ද අයිතිය ද ඇතුලු, පුරවැසි අයිතීන් අහෝසි කිරීම යි. එම තීන්දුවට, ප්‍රධාන දෙමල ධනේශ්වර පක්ෂයේ සහාය ද ලැබුනි. එම තීන්දුව හෙලා දුටු එකම පක්ෂය වූයේ, එම අවස්ථාවේ, සිංහල හා දෙමල, සියලු වැඩ කරන ජනතාවගේ අයිතීන් සඳහා සටන් වැදුනු, ට්‍රොට්ස්කිවාදී ලසසපයයි.

අද, වැඩෙන සමාජ ධ්‍රැවාන්තගතවීමේ හා දේශපාලන ආතතීන්ගේ කොන්දේසි යටතේ, අතීතයේ දී වැඩ කරන ජනතාව විසින් දිනාගන්නා ලද ජයග්‍රහන, යලිත් වරක් ප්‍රහාරයට ලක්ව තිබේ. එල්ටීටීඊ පාලිත ප්‍රදේශවල දෙමල ජනයාගේ ඡන්ද අයිතිය අහිමි කිරීමේ තීන්දුව මගින් පෙන්නුම් කෙරෙන්නේ, ප්‍රජාතන්ත්‍ර අයිතීන්ගේ ආරක්ෂාව උදෙසා දේශපාලන සංස්ථාපිතය තුල මොන යම් හෝ සැලකිය යුතු ආධාරක පදනමක් නොමැති බව යයි, සසප අනතුරු අඟවා සිටී.

සසප කම්කරුවන්ගෙන් ඉල්ලා සිටින්නේ, මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවට ද ජනවර්ගය, භාෂාව, ආගම හෝ ලිංග භේදය මත පදනම් වන සියලු ආකාරයේ වෙනස්කම් කිරීම්වලට ද එරෙහි වන ලෙසයි. දෙමල ජනතාවගේ මෙන් ම සියලු වැඩ කරන ජනතාවගේ, මූලික අයිතීන් ආරක්ෂා කිරීම, සිංහල හා දෙමල කම්කරුවන් විසින්, පීඩිත ජනතාවගේ සහාය ඇතිව, ඒකාබද්ධව ගෙන යා යුතු, සමාජවාදය සඳහා වූ අරගලය සමග අවියෝජනීය ලෙස බැඳී පවතී. මෙම ක්‍රියාමාර්ගයට සටන් වදින්නේ සසප ම පමනි.

© www.wsws.org